# ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට උපකාර කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ අත්‍යවශ්‍ය අංශ දෙකක් අත්වැල් බැඳගනී



එස්.එම්.ජී. පද්මිණී මහත්මිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානයක විශේෂ අධ්‍යාපන උපදේශකවරියකි. ඇය **1994** දී වෘත්තියට සම්බන්ධ වූ අතර ජාතික අධ්‍යාපන ආයතනයේ සහාය ඇතිව සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් විශේෂ අධ්‍යාපන පුහුණුව ලබා ඇත. ඇය දැනට විශේෂ අවශ්‍යතා සහිත දරුවන් **21** දෙනෙකුට උගන්වයි. තවත් විශේෂ අධ්‍යාපන උපදේශකවරියක් ඇයට සහාය වෙයි. බාහිර උපදේශකවරු සතියකට දින දෙකක් නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිසුන්ට  පූර්ව වෘත්තීය පුහුණුව ලබා දෙති. **“**හඳුනාගත් දුබලතා සහිත දරුවන් අපි වයස අවුරුදු දෙකේදී ඇතුළත් කරගෙන ඔවුන්ට පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙනවා. ඔවුන් තරමක් දියුණු වූ විට**,** අප ඔවුන්ව සාමාන්‍ය පන්තියේ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කරනවා. පාසල් අධ්‍යාපනයට සුදුසු ලෙස සංවර්ධනය වූ විට අප ඔවුන්ව පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කරනවා. දෙමාපියන්ගේ ආර්ථික අපහසුතා හෝ වෙනත් ප්‍රශ්න නිසා සමහර දරුවන් පාසල් යවන්නට බැරි වෙනවා. එවැනි දරුවන්  පූර්ව වෘත්තීය අධ්‍යාපනය අවසන් වනතුරු අප සමග රැඳෙනවා**,”** යි ඇය පැවසුවාය.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන **21** හේතුවෙන් වයඹ පළාත ශ්‍රී ලංකාවේ සුවිශේෂී පළාතක් වේ. වයස අවුරුදු දෙකෙන් පසු විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට මෙම මධ්‍යස්ථානවල අධ්‍යාපන අවස්ථාව ලබා දෙනු ලැබේ. පාසල් සහ නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන අතර සිසුන් අවස්ථානුකූලව යොමු වන අතර එම අංශවල නිලධාරීන් අතර අවබෝධය සිසුන් බාධාවකින් තොරව මාරුවීම සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ.

අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශය ඔස්සේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (**REACH-SS)** මගින් සංවිධානය කරන ලද විශේෂ වැඩසටහනක් **2023** ඔක්තෝම්බර් **24** වැනි දින වාරියපොළ අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. වයඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම එහි ප්‍රධාන අරමුණ විය.

ප්‍රාථමික අංශ ප්‍රධාන ගුරුවරු**,** විශේෂ අධ්‍යාපන ගුරුවරු**,** ගුරු උපදේශකවරු**,** නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානවල විශේෂ අධ්‍යාපන උපදේශකවරු**,** අධ්‍යාපන හා සමාජ සේවා දෙපාර්තමේන්තු දෙකෙහිම නිලධාරීහු මෙම එක්දින වැඩමුළුවට සහභාගී වූහ.

පළාතේ දුබලතා සහිත පුද්ගලයින්ගේ සුබසාධනය සම්බන්ධයෙන් තම දෙපාර්තමේන්තුව වගකීමෙන් කටයුතු කරන බව වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ**,** සමාජ සේවා නිලධාරී ඊ.එම්.එන්. ඒකනායක මහතා පෙන්වා දුන්නේය. **“**1995දී සමාජ සේවා දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස **109** ක ප්‍රජා පාදක පුනරුත්ථාපනය (**CBR)** ආරම්භ කළා. විශේෂ අධ්‍යාපන උපදේශකවරුන් දුබලතා සහිත ළමයින් සඳහා පෙර පාසල් සේවයේ යොදවා තිබෙන නිසා වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව සුවිශේෂී වෙනවා,’’ යි ඔහු පෙන්වා දුන්නේය.



“රජයේ පාසල්වල විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන වෙත පැමිණ අත්දැකීම් බෙදාහදා ගැනීමට සහ පාසල් අධ්‍යාපනයට සුදුසු සිසුන් හඳුනා ගැනීමට හැකියි. අවුරුදු **18**ට වැඩි පාසල් දරුවන් නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන වෙත යොමු කර ඔවුන්ව වෘත්තීය අධ්‍යාපනය සමඟ සම්බන්ධීකරණය කළ හැකියි. සමාජ සේවා නිලධාරීන් ඔවුන්ට ව්‍යවසායකත්වය සඳහාත් උදව් කරනවා.”

නිකවැරටිය අධ්‍යාපන කලාපයේ පාසල් **54** අතර විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් නවයක් ඇති බව නිකවැරටිය අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන ගුරු උපදේශක ඒ.එස්. තිලක් බණ්ඩාර මහතා පැවසීය. කලාපයෙහි විශේෂ අධ්‍යාපන ගුරුවරුන් **16** දෙනෙක් සේවය කරති. “විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින ඇතැම් මවුපියන් ආර්ථික ගැටලු රැසකට මුහුණ දී සිටිනවා. පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට තම දරුවන් රැගෙන ඒම සඳහා ප්‍රවාහන වියදම් දැරීම ඔවුන්ට දුෂ්කරයි. සමාජ සේවා දෙපාර්තමේන්තුව ඔවුන්ට මූල්‍යමය වශයෙන් උපකාර කරනවා. දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල පාසල් නොයන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටිනවා. පාසල්වල අනිවාර්ය අධ්‍යාපන කමිටු ඇති අතර ඒවා අදාළ ප්‍රදේශවල දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වගකිව යුතුයි. මීට අමතරව කලාප අධ්‍යාපන කාර්යාලවල ව්‍යාපෘති නිලධාරීන් සිටිනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුව වැනි සියලුම අංශ සමඟ සහයෝගයෙන් කටයුතු කරන විට එවැනි දරුවන් හඳුනාගෙන පාසල්වලට යොමු කළ හැකියි.”



අන්තර්කරණ අධ්‍යාපනය යනු සියලු දෙනාගේ සහයෝගය ඇතිව සැමට අධ්‍යාපනය ලබාදෙන පුළුල් සංකල්පයක් බව අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් සහ විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ (රාජකාරි ආවරණ) නිමල් හෙට්ටිආරච්චි මහතා පැවසීය. අන්තර්කරණ අධ්‍යාපනය යන්නෙහි නිර්වචනය උපුටා දක්වමින් ඔහු මෙසේ පැවසීය: "අන්තර්කරණ අධ්‍යාපනය යනු පාසල් වයසේ සියලුම දරුවන් තම සහෝදර සහෝදරියන් සහ අසල්වැසි සම වයස් මිතුරන් සමඟ ළඟම පාසලේ සාමාන්‍ය පන්ති කාමරය තුළ ගුරුවරුන් යටතේ අධ්‍යාපනය ලැබීමයි.’’

"අංක **37/2020** චක්‍රලේඛය සියලුම සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සහතික කර තිබෙනවා. එම චක්‍රලේඛයට අනුව ළමයින්ගේ වයස අවුරුදු තුනේදී සෞඛ්‍ය හා අධ්‍යාපන බලධාරීන්ගේ සහාය ඇතිව විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කළ යුතුයි. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්

සම්බන්ධයෙන් නිර්දේශ පහක් සපයනු ලැබේ. කායික දුබලතා නිසා පාසල් යාමට නොහැකි වූ දරුවන්ට නිවෙස් සිට අධ්‍යාපනය ලබාදීම ලබන වසරේ ආරම්භ විය හැකියි. 1 ශ්‍රේණියේ අන්තර්කරණ අධ්‍යාපනයට ඒකාබද්ධ කිරීමට සූදානම් කිරීම සඳහා අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වයස අවුරුදු හතරේදී පාසල්වලට ඇතුළත් කරගැනීමට නියමිතයි. විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපනය සඳහා දැනටමත් එක් මාර්ගෝපදේශ ග්‍රන්ථයක් සම්පාදනය කර තිබෙනවා. රජයේ පාසල්වල විශේෂ අවශ්‍යතා ඇති ළමයින් සඳහා අවස්ථා සම්බන්ධයෙන් තිබූ සීමාවන් ඉවත් කර තිබෙනවා," යි නිමල් හෙට්ටිආරච්චි මහතා පැවසීය.

වයඹ පළාත් විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්. තනුජා රත්නායක මහත්මිය පළාතේ පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සවිස්තරාත්මකව පැහැදිලි කළාය. නිකවැරටිය අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - විශේෂ අධ්‍යාපන, රසිකා දිසානායක මිය අන්තර්කරණ අධ්‍යාපනයට අදාළ සියලුම අංශ අතර සහයෝගීතාවයේ වැදගත්කම විද්වත් කතිකාවේදී අවධාරණය කළාය. "සමාජ සේවා දෙපාර්තමේන්තුවත් සමග ඒකාබද්ධ වීමෙන් අපට විශේෂ අවශ්‍යතා ඇති ළමයින්ට වඩා හොඳ සේවාවක් ලබාදෙන්නට හැකියාව තිබෙනවා. අප මේ වැඩසටහන සංවිධානය කළේ ඒ සහයෝගිතාව ආරම්භ කරන්නටයි. නිකවැරටිය කලාපයේ සිටින අපගේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 16 දෙනා නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඉතා කැමැත්තෙන් සිටිනවා."

අධ්‍යාපනයේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම අන්තර්කරණ අධ්‍යාපනයේ එක් අරමුණක් බව **REACH-SS** ව්‍යාපෘතියේ කණ්ඩායම් නායක ෂුහෙයි ඔගුචි මහතා ප්‍රකාශ කළේය.

"අන්තර්කරණ අධ්‍යාපනය යනු සියලුම පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඉල්ලා සිටින සාමූහික වගකීමකි. සහජීවනයෙන් එකට වැඩ කිරීමෙන්, අන්තර්කරණ අධ්‍යාපනයේ පරිවර්තනීය බලය අපට හොඳින් අවබෝධ කර ගත හැකියි. සියලුම සිසුන් සාර්ථකත්වය අත්පත් කරගන්නා ලෝකයක් එමගින් අපට නිර්මාණය කළ හැකියි. අන්තර්කරණ අධ්‍යාපනයට දායක වන සියලුම අංශ අතර සහයෝගීතාවය ප්‍රවර්ධනය කළ යුතුයි. මෙම වැඩමුළුව සුවිශේෂී වන්නේ එම නිසායි. මෙම අංශ දෙක හමු වී එකිනෙකා සමඟ කරන්නේ කුමක්ද යන්න සාකච්ඡා කළ පළමු අවස්ථාව මෙයයි," යි ඔගුචි මහතා පෙන්වා දුන්නේය.